පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය **07**

# අවසාන වාර පරීක්ෂණය - 2023

## ඉතිහාසය I , II

පාසලේ නම : ........................................................................................................

ඇතුළත්වීමේ අංකය : ................................ කාලය : පැය 02 යි.

### I කොටස

**සැලකිය යුතුයි :**

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

---

- **ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.**

01. අතීතයේ පැවති හේන් සෙල්ලිපිවල හඳුන්වා ඇත්තේ,

(1) සෙහෙන් (2) සේන් (3) පිටබිම්

02. මහා විජයබාහු රජතුමා ගැන හැදෑරීමට වැදගත් නොවන මූලාශ්‍රයකි,

(1) මහාවංසය (2) පනාකඩුව තඹ සන්නස (3) සංගමු විහාර ලිපිය

03. ළමා කාලයේ දොරමඩලාව නම් ගමේ ජීවත් වූ බව සඳහන් වන රජතුමා කවරෙක්ද?

(1) මහසෙන් (2) පණ්ඩුකාභය (3) මහා පරාක්‍රමබාහු

04. මිණිපේ ගංදෙණිය පර්වතයේ බලකොටුවක් පිහිටුවාගෙන සිටි සෙනවියා කවුරුන්ද?

(1) සංඛ (2) සුභ (3) බුවනෙකබාහු

05. ' බටහිර වෛද්‍ය විද්‍යාවේ පියා ' වශයෙන් සැලකෙන ග්‍රීක ජාතිකයා කවරෙක්ද?

(1) සොක්‍රටීස් (2) ඇරිස්ටෝටල් (3) හිපොක්‍රටීස්

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා දී ඇති වගන්ති වල හිස්තැනට වඩාත් සුදුසු පිළිතුර වරහනින් තෝරා ලියන්න.**

06. තෝනිගල සෙල්ලිපියේ මහ කන්නය හඳුන්වා ඇත්තේ ............................................................ නමිනි. (අකලහස/පිටදඩහස)
07. යාපන රාජ්‍යයේ ආරම්භක පාලකයා ............................................................ නම් වේ. (විජයකුලංගෛ/සංකිලි)
08. රෝම අධිරාජ්‍යයට අයත්ව පැවති ජෙරුසෙලම අසල බෙත්ලෙහෙමේදී ....................................................... උත්පත්තිය සිදුවී තිබේ. (ජේසුතුමාගේ/ මහම්මත්තුමාගේ)
09. උඩරට ප්‍රාදේශීය පාලකයෙකු වූ ජෝතිය සිටාණන්ගේ කැරැල්ල .................................................... කුමරු විසින් මැඩපවත්වන ලදි. (අම්බුලුගල/සපුමල්)
10. නිශ්ශංක අලකේශ්වර ඇමතිවරයා විසින් ................................................. බලකොටුව ඉදිකරවන ලදි. (කෝට්ටේ/යාපනය)

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශ නිවැරදි නම් '√' ලකුණ ද වැරදි නම් 'X' ලකුණද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

11. 'ශ්‍රී මාර ශ්‍රී වල්ලභ'නම් පාණ්ඩ්‍ය රජු මෙරට ආක්‍රමණයක් කලේ දෙවන සේන රජුගේ කාලයේදී ය. (  )
12. 'අන්තානි කණු'යනු රාජ්‍ය දීමනා පිළිබඳ සඳහන් ශිලා ලිපි විශේෂයකි. (  )
13. 'කංචි පුරය'පාණ්ඩ්‍ය රාජ්‍යයේ අගනුවර විය. (  )
14. I වන පරාක්‍රමබාහු රජු විසින් නගරගිරි කිත්ති නම් සෙනවියාට දුන් ත්‍යාග පිළිබඳව දෙවනගල සෙල්ලිපියේ සඳහන් වේ. (  )
15. ඉතාලිය යුරෝපයේ සෙසු රටවලින් වෙන් වන්නේ ඇපිනයින් කඳු වැටියෙනි. (  )

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට දී ඇති 'A' සහ 'B' තීරු ගැලපෙන අයුරින් යා කරන්න.**

| 'A' | | 'B' |
|---|---|---|
| 16. පැන්තියන් දේවස්ථානය. | (  ) | A. අම්බලන්ගොඩ |
| 17. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය. | (  ) | B. රෝමය |
| 18. වෙස්මුහුණු | (  ) | C. ග්‍රීසිය. |
| 19. විද්‍යාරම්භ | (  ) | D. පාකිස්ථානය |
| 20. මොහෙන්දජාරෝ. | (  ) | E. අධ්‍යාපනය ඇරඹීම |

(20×2 =40)

## II කොටස

- ❖ **පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.**
- ❖ **ප්‍රශ්න අංක 02 සිට 07 දක්වා ප්‍රශ්න වලින් තවත් ප්‍රශ්න 04 ක් තෝරා ගෙන පිළිතුරු සපයන්න.**

01.

1. 

A

(i) A ඡායාරූපයෙන් දැක්වෙන ඓතිහාසික ගොඩනැගිල්ල අයත් රාජධානිය කුමක්ද?

..........................................................................................................

(ii) එය කරවන ලද රජතුමා කවරෙක් ද?

..........................................................................................................

(iii) එතුමා විසින් කරන ලද ශාසනික සේවා සඳහා උදාහරණ 02 ක් ලියන්න.

..........................................................................................................

..........................................................................................................

(ලකුණු 04)

2. 

B

(i) B රූපයෙන් දැක්වෙන්නේ මොනවාද?

..........................................................................................................

(ii) ඒවා අයත් කර්මාන්තය කුමක්ද?

..........................................................................................................

(iii) මෙම කර්මාන්තයේ දක්නට ලැබෙන වෙනත් භාණ්ඩ වර්ග 02ක් ලියන්න.

..........................................................................................................

..........................................................................................................

(ලකුණු 04)

3. 

C

(i) C ඡායාරූපයෙන් දැක්වෙන ප්‍රතිමාව කුමක්ද?

..........................................................................................................

(ii) මෙම ප්‍රතිමාව අයත් ශිෂ්ටාචාරය කුමක්ද?

..........................................................................................................

(ii) මෙම නිර්මාණය කිරීමට යොදාගත් දුර්ලභ ද්‍රව්‍ය 02 ක් ලියන්න.

................................................................................................................................... (ලකුණු 04)

02. (i) අතීත කුඹුරු ගොවිතැනේ දී යොදාගත් උපකරණ 03ක් නම් කරන්න. (ලකුණු 03)

(ii) වී ගොවියා ගොයම ආරක්ෂා කරගැනීමට අතීතයේ භාවිතා කළ ස්වාභාවික ක්‍රම 02 ක් ලියන්න. (ලකුණු 04)

(iii) හේන් වගාවේ දී හේන ආරක්ෂා කර ගැනීමට ගොවීහු අනුගමනය කල ක්‍රම පිළිබඳව කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 05)

03. (i) අතීතයේදී අපේ රජවරු විදේශ වෙළඳ සම්බන්ධතා පැවැත් වූ රටවල් 03 ක් නම් කරන්න. (ලකුණු 03)

(ii) අප රටට විදේශ රටවලින් ආනයනය කරන ලද භාණ්ඩ වර්ග 04 ක් නම් කරන්න. (ලකුණු 04)

(iii) බදුලු ටැම් ලිපියට අනුව රටතුල වෙළඳාම පවත්වාගෙන යාමේ දී පනවා තිබූ නීති රීති පිළිබඳව කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 05)

04. (i) පහත සඳහන් රාජ්‍යයන්හි අගනුවරවල් නම් කරන්න.

A - පල්ලව රාජ්‍යය

B - පාණ්ඩ්‍ය රාජ්‍යය

C – චෝල රාජ්‍යය (ලකුණු 03)

(ii) I විජයබාහු රජතුමා විදේශයන්ගෙන් එල්ල වන බලපෑම් වලක්වා ගැනීමට ගත් ක්‍රියාමාර්ග 02 ක් ලියන්න. (ලකුණු 04)

(iii) I විජයබාහු රජතුමාගෙන් අපට ගත හැකි ආදර්ශ පිළිබඳව කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 05)

05. (i) රජරට ශිෂ්ටාචාර සමයේ දී ජනතාව එක්රැස් වී පැවැත්වූ උත්සව 03 ක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පොළොන්නරුව රාජධානිය බිඳවැටීමෙන් පසු නිරිතදිග ප්‍රදේශයේ ව්‍යාප්ත වූ රාජධානි 04 ක් නම් කරන්න. (ලකුණු 04)

(iii) II පරාක්‍රමබාහු රජු රට සතුරන්ගෙන් ආරක්ෂා කරගැනීමට ක්‍රියාකළ ආකාරය පිළිබඳව කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 05)

06. (i) අග්‍රගණ්‍ය ග්‍රීක දාර්ශණිකයන් 03 දෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

(ii) රෝම ශිෂ්ටාචාරයෙන් ලොවට උරුම වූ දායාද 04 ක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ග්‍රීක ජන ජීවිතය පිළිබඳව කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 05)

07. පහත සඳහන් ස්ථාන ලංකා සිතියමක ලකුණු කරන්න.

(i)පොළොන්නරුව

(ii) කුරුණෑගල

(iii) දැදුරු ඔය

(iv) සීගිරිය

(v) මින්නේරි වැව

(vi) වාකිරිගල (ලකුණු 06 x 2 = 12)

